**පාඩම :- දිග ( 1 වන සතිය)**
**කාලච්ඡේද ගණන :- 08**

- පෙලපොතේ 39, 40 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. දිග, උස, පළල, ගැඹුර, ගනකම යෙදෙන අවස්ථා සඳහා උදාහරණය බැගින් ලියන්න.

- දිග මැනීම සඳහා භාවිතා කරන මිනුම් උපකරණ 5 ක් ලියන්න.

පහත දැක්වෙන දිග මැනීම සඳහා සුදුසු මිනුම් ඒකකය තෝරා යා කරන්න.

| **දිග** | **මිනුම් ඒකකය** |
|---|---|
| කාසියක ගනකම | මිලිමීටර (mm) |
| නිමාලිගේ උස | සෙන්ටිමීටර (cm) |
| පොතක දිග හා පළල | මීටර (m |
| නගර දෙකක් අතර දුර | කිලෝමීටර (km) |
| මුහුදු පත්ලේ ගැඹුර | |

- පෙලපොතේ 42 පිටුව බලන්න. 15.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු ගුරුතුමා/ ගුරුතුමිය සමඟ සාකච්ඡා කරන්න.

- පෙලපොතේ 43, 44 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.

$10\text{ mm} = 1\text{ cm}$ ද $\quad 1\text{mm} = \frac{1}{10}\text{ cm}$ ද $\quad 1\text{mm} = 0.1\text{ cm}$ බව ද හඳුනා ගන්න.

සෙන්ටිමීටරවලින් දක්වා ඇති දිගක් මිලිමීටරවලින් දැක්වීමට සෙන්ටිමීටර ලෙස දී ඇති ගණන 10 න් ගුණ කල යුතුය.

උදා:- 7 cm, මිලිමීටරවලින් දක්වන්න.

7 cm = 7 X 10 mm
= 70 mm

පහත දැක්වෙන දිග මිලිමීටරවලින් දක්වන්න.

1) 5 cm 2) 8 cm 3) 9 cm 4) 10 cm 5) 24 cm

- පහත දැක්වෙන දිග ප්‍රමාණ සෙන්ටිමීටර හා මිලිමීටර වලින් නැවත ලියන්න.

උදා:- 15 mm = 1 cm 5 mm

1) 12 mm 2) 25 mm 3) 37 mm 4) 95 mm 5) 105 mm

| |
|---|
| මිලිමීටරවලින් දක්වා ඇති දිගක් සෙන්ටිමීටරවලින් දැක්වීමට මිලිමීටර ලෙස දී ඇති ගණන 10 න් බෙදිය යුතුය. |

උදා:- 80 mm , සෙන්ටිමීටරවලින් දක්වන්න.

80 mm $= \frac{80}{10}$ cm
= 8 cm

පහත දැක්වෙන දිග සෙන්ටිමීටරවලින් නැවත ලියන්න.

1) 50mm 2) 70 mm 3) 150 mm 4) 380 mm 5) 550 mm

පහත දී ඇති A කොටුවේ ඇති දිගට සමාන අගය B කොටුවෙන් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 7 cm | 35 mm |
| 3 cm 5 mm | 70 mm |
| 1 cm 9 mm | 127 mm |
| 12 cm 7 mm | 19 mm |
| 13 cm 8mm | 138 mm |

- පෙලපොතේ 45 පිටුවේ 15.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

| |
|---|
| මීටර (m) වලින් දක්වා ඇති දිගක් සෙන්ටිමීටර (cm) වලින් දැක්වීමට මීටර ලෙස දී ඇති ගණන 100න් ගුණ කල යුතුය. |

උදා:- 8 m, සෙන්ටිමීටරවලින් දක්වන්න.

8 m = 8 X 100 cm
= 800 cm

පහත දැක්වෙන දිග සෙන්ටිමීටර (cm) වලින් දක්වන්න.

1) 7m 2) 6m 25cm 3) 7m 18 cm 4) 6.75m 5) 6.85m

| |
|---|
| සෙන්ටිමීටර (cm) වලින් දක්වා ඇති දිගක් මීටර (m) වලින් දැක්වීමට සෙන්ටිමීටර ලෙස දී ඇති ගණන 100න් බෙදිය යුතුය. |

උදා:- 700c m, මීටරවලින් දක්වන්න.

700cm $= \frac{700}{100}$ m
= 7m

පහත දැක්වෙන එක් එක් දිග මීටර (m) වලින් දක්වන්න.

1) 200 cm 2) 1100 cm 3) 79 cm 4) 900 cm 5) 241 cm

- පෙලපොතේ **48** පිටුව බලන්න. 15.4 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු ගුරුතුමා/ ගුරුතුමිය සමඟ සාකච්ජා කරන්න.